# උඩපොල පාරම්පරික විෂ වෛද්‍ය ක්‍රමයේ සර්ප දෂ්ට හඳුනා ගැනීමේ ක්‍රම සහ විෂ චිකිත්සාව

පාරම්පරික වෛද්‍ය ඩී. එම්. චන්ද්‍රසේකර

සර්ප විෂ සඳහා බටහිර ප්‍රතිකාර ප්‍රචලිත නොවූ හා එම ප්‍රතිකාර පහසුවෙන් ලබා ගැනීමට ඇති හැකියාව දුලබ වූ යුගයක පටන් විෂ චිකිත්සාව සඳහා වූ එක ම පිටිවහල වූයේ දේශීය විෂ වෙදකමයි. කුරුණෑගල, අනුරාධපුරය වැනි සර්ප දෂ්ට බහුල ව සිදුවන ප්‍රදේශවල සිටින ජනතාවගේ විෂ වෛද්‍ය අවශ්‍යතා සඳහා උඩපොල පාරම්පරික වෛද්‍ය ක්‍රමය මහගු සේවයක් සිදු කොට ඇත. විෂ චිකිත්සාවට අමතර ව වලිප්පුව, සන්නි, වාත රෝග හා අලර්ක හෙවත් ජලභීතිකා සඳහා වූ චිකිත්සීය දැනුම මෙම පරම්පරාව සතුව පැවතුණි.

මෙම පාරම්පරික විෂ වෛද්‍ය ක්‍රමය මගින් සර්ප දෂ්ටයක් සිදු වී ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගියෙකුගේ රෝග නිර්ණය කිරීමට, දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීමට හා රෝගියාගේ සාධ්‍යාසාධ්‍යතාව නිර්ණය කිරීමට භාවිත කරන ක්‍රමවේද පහත පරිදි වේ.

- දූත ලක්ෂණ අනුව දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීම.
- රෝගියාගේ මුල් ප්‍රකාශනය අනුව දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීම.
- පාරම්පරික ඖෂධ යෙදීම මගින් සාධ්‍යාසාධ්‍යතාවය තීරණය කිරීම.

**රෝගියාගේ මුල් ප්‍රකාශනය අනුව දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීම.**

රෝගියාගේ මුල් ප්‍රකාශය ගෙන එහි අල් අකුරු ඉවත් කර ඉතිරි අකුරු සංඛ්‍යාව මහපට ඇඟිල්ලෙන් පටන්ගෙන අතේ ඇඟිලිවලට පවරමින් ගණන් කළ විට ගණන් කිරීම අවසන් වන ඇඟිල්ල අනුව දෂ්ටය සිදු කළ සර්පයා හඳුනා ගනු ලැබේ. අදාළ ඇඟිල්ලට අනුව දෂ්ට කළ සර්පයා පහත පරිදි වේ.

| ඇඟිල්ල | සර්පයා |
|---|---|
| සුලැඟිල්ල | නාගයා |
| වෙදැඟිල්ල | පොළඟා |
| මැදැඟිල්ල | කරවලා |
| තර්ජනැඟිල්ල | තෙලිස්සා |
| මහපටැඟිල්ල | විෂ රහිත සර්පයෙකි |

ඉන් අනතුරුව සර්පයා ගැහැණු සතෙක් ද, පිරිමි සතෙක් ද යන්න තීරණය කිරීම සඳහා පහත ක්‍රියාවලිය යොදා ගනී. ඇඟිල්ල නවා පළමු පුරුකේ සිට ගණන් කරයි. එහි දී පළමු පුරුක නම් ගැහැණු සතෙකු බව ද, දෙවන පුරුක නම් පිරිමි සතෙකු බව ද, තෙවන පුරුක නම් නපුංසක සතෙකු බව ද තීරණය වේ.

ප්‍රතිකාර කිරීම සඳහා රෝගියා භාර ගැනිමට පෙර රෝගියාගේ සාධ්‍යාසාධ්‍යතාව තීරණය කිරීම සඳහා "අවසාන බෙහෙත" නම් ඖෂධයක් දෙන අතර එයින් රෝගය කර්මාණුරූපව සිදු වූ කර්මජ රෝගයක් ද, නැතහොත් රෝගීයාට ජීවත්වීමේ අවස්ථාවක් තව ම ඇති බව ද තීරණය වේ. අනතුරුව දෂ්ට ස්ථානය පරීක්ෂා කර බැලේ. ඒ සඳහා විෂ ගලක් මාර්ගයෙන් හෝ දොඩම් කට්ටක් මාර්ගයෙන් හෝ මල නොබැඳුණ සියුම් ආයුධයක් මාර්ගයෙන් කුඩා පැරීමක් සිදු කර ලේ ගැලීමට සලස්වා උඩපොල පාරම්පරික ක්‍රමයට සැකසූ විෂ ගල තබයි. විෂ ගලක් නොමැතිවිට ඉඟිනි ඇටයක් දෙකට පලා දෂ්ට ස්ථානයේ තැබීම හෝ නැවුම් උළු කැටයක් හෝ නැවුම් වලං පතුරක් තබා විෂ උරා ගැනීම සිදුකරයි.

අනතුරුව ක්ෂණිකව විෂ ඉවත් කිරීමට වීදුරු බෝතලයකට උතුරුවා ගත් ජලය පුරවා නැවත ඉවත් කර උණුසුම තිබිය දී ම දෂ්ට මුඛය පාදා බෝතලයේ කට පැත්තෙන් දෂ්ට ස්ථානය වැසීමෙන් විෂ ඉවත් කෙරේ.

රෝගියාගේ තත්ත්වය අනුව අවස්ථානෝචිත ව නස්න, පානීය ඔසු, ඖෂධ ගැල්වීම්, මැල්ලුම් බැඳිම, වේදු ඇල්ලීම, අංජනම් ලෑම, වත්තම් ගිනි කබල් හිස මුදුනේ තැබීම ආදිය සිදුකරයි. විෂ හරණ තෛලය, ගරුඬරාජ තෛලය, විෂනීල තෛලය චිකිත්සාව සඳහා යොදා ගන්නා තෛල වර්ග කිහිපයකි.

චිකිත්සාවේ දී යොදාගන්නා විශේෂිත ඖෂධ කිහිපයක් පහත පරිදි වේ.

- නාග දෂ්ටයක දී - බස්නාහිර පැත්තෙන් ගලවා ගන්නා ලද මුරුංගා පොතු කැබැල්ලක් තලා නස්න කිරීම.
- නාග දෂ්ටයක දී විෂ ආමාශ ගතවීම වැළැක්වීම සඳහා වයස අවුරුදු 15ට අඩු දරුවකුගේ මුත්‍ර කෝප්පයක් පමණ පානයට දීම.
- පොළොං දෂ්ටයක දී - බස්නාහිර පැත්තෙන් ගලවා ගන්නා ලද සේරු මුලක පොතු දෙහි ඇඹුලෙන් අඹරා නස්න කිරීම.
- කරවැල් / මාපිල් විෂට - අධික සෙම ඉවත් වීම සඳහා තුඹ කරවිල කොළ ඉස්ම නස්න කිරීම.
- ඕනෑ ම සර්ප දෂ්ටයක දී - සුවඳකොට්ටම්, ගුගුල්, වදකහ සහමුල, වියන්දුඹුලු සමප්‍රමාණ ඇලෙන පදමට අඹරා තිබ්බටු ගෙඩියක ප්‍රමාණයට ගුලිකර පවනේ වේළා තබාගෙන අවශ්‍ය විට ඇල් දියෙන් හෝ දෙහි ඇඹුලින් දියකර බීමට දීම.

මෙවැනි පාරම්පරික චිකිත්සීය දැනුම උපයෝගීත්වයෙන් සර්ප දෂ්ටයට ලක් වූ ලක් වැසි ජනයාහට අතීතයේ දී ද අප සේවය කළ අතර වර්තමානයේ දී ද සේවය කරමින් සිටී. එමෙන් ම උඩපොල පාරම්පරික වෛද්‍ය ඥානය සමාජයට මෙසේ බෙදා දීමෙන් අනාගතයේ දී ද ලක්වැසියාහට සෙත සැලසීම අපගේ ඒකායන අරමුණයි.